බෞද්ධ ශිෂ්ටාචාරය

රත්නපුර කලාපය - 13 ශ්‍රේණිය

සති පාසල

10.1 නිපුණතා මට්ටම

බුද්ධ ප්‍රතිමා

බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය :

- බෞද්ධ කලා ශිල්පයන්හි ආරම්භය ඈත අතීතයට දිවයයි. මෞර්ය යුගයේ බිහි වූ කලා නිර්මාණ එයට සාක්ෂ්‍ය සපයයි. බෞද්ධ කලාවේ ශ්‍රේෂ්ඨ නිර්මාණයක් ලෙස සැලකෙන බුද්ධ ප්‍රතිමාව **උද්දේශික චෛත්‍යයට** ඇතුළත් ය.
- උද්දේසික වශයෙන් බුද්ධ ප්‍රතිමා නිර්මාණය කොට වන්දනාමාන කිරීම මුල් අවධියේ සිදු නොවුණ අතර එය සිදු වී ඇත්තේ බුද්ධ පරිනිර්වාණයෙන් සියවස් කීපයක් ඉක්මගිය පසුව යැයි සැලකෙයි.
- මානව රූපීව බුද්ධ ප්‍රතිමාව නිර්මාණය කිරීමට ප්‍රථම ඒ වෙනුවට විශේෂ සංකේත කිහිපයක් භාවිතයට ගෙන ඇත. උදාහරණ බෝධිය, වජ්‍රාසනය, පද්මය, සිරිපතුල, ධර්ම චක්‍රය, ස්තූපය ආදී සාධක **සාංචි, භාර්හුත් හා අමරාවතී** කැටයම් මඟින් හෙළිදරවු වෙයි.

සාංචි කැටයම්

භාර්හුත් කැටයම්

අමරාවතී කැටයම්

- සංකේත භාවිතයෙන් බුද්ධ වන්දනාව කෙරෙහි යොමු වන්නට ඇත්තේ **කෙලෙසුන් ප්‍රහීණ කළ බුදු රජාණන් වහන්සේගේ ප්‍රතිරූපයක් නිර්මාණය කිරීමට පැවති බිය හා අසීමිත ගෞරවය අපහසු යැයි සැලකීම** ආදී කරුණු නිසා විය හැකිය.
- පැරණි කලා ශිල්පීන්ගේ අපොහොසත්කම හෝ ත්‍රිපිටකාගත තහනමක් හෝ නිසා බුද්ධ ප්‍රතිමා නිර්මාණය කිරීමෙන් වැළකී නො සිටිය බැව් **ආනන්ද කුමාරස්වාමි හා ගංගුලි** සඳහන් කර ඇත.
- ඒ බව අංගුත්තර නිකායේ **"එක් පුග්ගලෝ භික්ඛවේ උප්පජ්ජමානෝ උප්පජ්ජති අදුතියෝ අසහායෝ අප්පටිමෝ අප්පටිසමෝ අප්පටිභාගෝ අප්පටිපුගග්ලෝ අසමෝ දිපදාන අග්ගෝ කතමෝ ඒක පුග්ගලෝ තථාගතෝ අරහං සම්මා සම්බුද්ධෝ"** යනුවෙන් දැක්වෙන පරිදි **''මහණෙනි එක් පුද්ගලයෙක් ලොව උපදින්නේ ය, ඔහු අද්විතීය ය, අසහාය ය, අප්‍රතිම ය, අප්‍රතිභාගය, අප්‍රති පුද්ගලය ය, අසමසම ය, ඒ තථාගත වූ අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ය''** යනුවෙන් විස්තර කරන ප්‍රකාශය කලාකරුවා බුද්ධ ප්‍රතිමා නිර්මාණය කෙරෙහි යොමු නොවීමට හේතු වූවා යැයි අනුමාන කළ හැකිය.

බුදු පිළිම නෙළීම ආරම්භය පිළිබඳ ව විවිධ මත

- ප්‍රවාද කථා, සාහිත්‍ය මූලාශ්‍රය හා පුරාවිද්‍යාත්මක සාධක පදනම් කරගෙන යථෝක්ත මත ඉදිරිපත් වී ඇත.
- **සාහිත්‍යාගත මූලාශ්‍රයයක්** වන **කෝසලබිම්බ වර්ණනාවේ** දැක්වෙන පරිදි **කොසොල් රජතුමා** බුදුරදුන් ජීවමාන කාලයේ ම **සඳුන් ලී අරටුවකින් බුද්ධ ප්‍රතිමාවක්** නිමවා වැඳුම් පිදුම් කළහ.
- **කාලිංගබෝධි ජාතකයට** අනුව **අනේපිඬු සිටුතුමා බුද්ධ ප්‍රතිමාවක් නෙළීමට** බුදු රදුන්ගෙන් අවසර ලබාගත් බව සඳහන්වේ.
- **සමන්තපාසාදිකාවේ** දැක්වෙන ආකාරයට **අශෝක රජතුමා මහාකාල නම් නාගරාජයකු** විසින් මවන ලද බුද්ධ ප්‍රතිමාවකට සත් දිනක් වැඳුම් පිදුම් කළ බව සඳහන්වේ.
- ඇතැම් මූලාශ්‍රයයනට අනුව බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය බුද්ධ කාලයේ ම සිදු වූ බවට සාධක ඇති අතර ඒ පිළිබඳ ව උගතුන් විසින් විවිධ මත පළ කර ඇත.
- **පුරාවිද්‍යාත්මක සාක්ෂ්‍ය අනුව** බුදු රදුන්ගේ රූපය මානවාකාරයෙන් නිර්මාණය වී ඇත්තේ **ක්‍රි. පූ. පළමු වන සියවසේ හෝ ක්‍රි.ව.පළමු වන සියවසේ හෝ කණිෂ්ක රාජ්‍ය** සමයේ බවය.
- **කණිෂ්ක රජුගේ රුව සහිත කාසිවල බුදු රදුන්ගේ රුව ද** නිරූපණය කර ඇත.

- **පෙෂාවෝරයේ** ඔහු විසින් ම නිම කරවන ලද **ෂා-ජී- කි-ධේරී ධාතු කරඬුවෙහි** ද බුද්ධ රූපයක් කැටයම් කර ඇත.
- **කණිෂ්ක රාජ්‍ය වකවානුවේ ම ගන්ධාර හා මථුරා යන** ප්‍රදේශවල ද බුද්ධ ප්‍රතිමා නිර්මාණය කිරීම ආරම්භ වූ බවට සාධක ඇත.
- මෙම සම්ප්‍රදාය දෙකෙන් පළමු ව ප්‍රතිමා නිර්මාණය වූයේ කුමන ප්‍රදේශයේ ද යන්න පිළිබඳ ව ද මතවාද පවතියි.
- **වින්සන්ට් ස්මිත්, පර්සි බ්‍රවුන්, පුෂේ** වැනි විද්වතුන් **ගන්ධාර ප්‍රදේශයේ** බුද්ධ ප්‍රතිමා නිර්මාණය පළමු ව සිදු වූ බව ප්‍රකාශ කරයි.
- **ආනන්ද කුමාරස්වාමි, හැවල්** වැනි අය **මථුරා ප්‍රදේශයේ** පළමු ව බුද්ධ ප්‍රතිමා නිර්මාණය වූවා යැයි ප්‍රකාශ කරයි.
- **ගන්ධාරයේ** ඇති වූ බුදු පිළිමය **ග්‍රීක-රෝම කලාවේ** ආභාසය ඇති ව **ඇපලෝ දේව රූප** ගුරු තන්හි තබාගෙන නිර්මාණය කර ඇතැයි සැලකෙයි.
- **මථුරා ප්‍රතිමා** නිර්මාණය කර ඇත්තේ **භාරතීය යක්ෂ** රූපවල රෞද්‍ර ස්වරූපය ක්‍රමයෙන් ඉවත් කර සිවුරක් පෙරවීමෙන් යැයි සැලකෙයි.
- මෙම සම්ප්‍රදාය දෙකෙහි සුවිශේෂ වෙනස්කම් රැසක් දක්නට ලැබෙයි.

ගන්ධාර පිළිමවල ලක්ෂණ

1. මහා කාරුණික ලීලාව දක්වයි.
2. ආභංග හෙවත් මඳක් නැමුණු කෝමල සිරුර නිරූපණය කරයි.
3. අත් සංවර ව සිරුරට ළං ව ඇත.
4. නෙත් අඩවන් ය, තොල් සිහින් ය, පරිමානුකූල පිම්බී කම්මුල් ය. (මනා ව සැකසුණු කම්මුල් වලින් යුක්ත ය)
5. හිසකේ ස්වාභාවික ය.
6. සිවුර ග්‍රීක ටෝගාවකට සම ය, රැලි ස්වාභාවික ය.
7. පද්මාසනය, කුඩා නෙළුම් මලක් මත දුෂ්කර ව වැඩ සිටින විලාසයකි.

මථුරා පිළිමය ලක්ෂණ

1. ශාක්‍ය සිංහ ලීලාව දක්වයි. ඇතැම් විට පාමුල සිංහ රුවක් ඇත.
2. සමභංග හෙවත් ඍජු ව දෙපා මඳක් දුරස් කොට තබාගෙන ඇත.
3. අත් සිරුරට ඈත් ය. ඇතැම් විට ඉණට අත් ගසා ගත් අයුරු දක්වේ.
4. නෙත් විවෘත ය, තොල් මහත් ය, කම්මුල්
5. හිසකේ ශෛලිගත ය, කැරලි ගැසී ඇත.
6. විනිවිද පෙනෙන තරම් දුහුල් සිවුරකි, රැලි අඩු ය, ඝන ය, ශෛලිගත ය.
7. පද්මාසනය, නෙළුම් මල මත පහසුවෙන් වැඩ සිටින විලාසයකි.

- පසු කාලයේ ගන්ධාර, මථුරා සම්ප්‍රදාය දෙකෙහි ම ආභාසය ඇති ව දකුණු ඉන්දියාවේ අමරාවතී සම්ප්‍රදායය බිහි විය.

ශ්‍රී ලංකාවේ බුද්ධ ප්‍රතිමා

- **මහාවංස** සඳහනට අනුව මෙරට බුද්ධ ප්‍රතිමා නිර්මාණය කිරීම **දේවානම් පියතිස්ස** රාජ්‍ය වකවනුව තෙක් ඈතට දිවයයි. **දේවානම් පියතිස්ස** රජතුමා **ථූපාරාමයේ** තැන්පත් කළ **උරුශිලා ප්‍රතිමාව** පසුව **කනිට්ඨ තිස්ස රජතුමා පාචීන තිස්ස පබ්බත විහාරයේ** තැන්පත් කළහ.
- **දුටුගැමුණු රජතුමා** රුවන්මැලි සෑ **ගර්භයේ රනින් කළ බුද්ධ ප්‍රතිමාවක්** තැන්පත් කළ බව සඳහන්වේ.
- **මුලින් බුද්ධ ප්‍රතිමා නිර්මාණය කිරීමේ ගෞරවය ලාංකේය කලාකරුවන්ට හිමි යැයි මත පළ වී ඇත.**

- **ඩී. ටී. දේවේන්ද්‍ර, සිරි ගුණසිංහ, නන්දදේව විජේසේකර** යන විද්වතුන් එම මතය ඉදිරිපත් කරන්නන් අතර ප්‍රමුඛත්වයක් ගනී.
- එහෙත් **ක්‍රි.ව. දෙවන ශතවර්ෂයට පෙර නෙළන ලදැයි සැලැකෙන පිළිම කිසිවක් ලංකාවේ පුරාවිද්‍යාඥයන්ට තව ම හමු වී නැත.**

- **මහ ඉලුප්පල්ලමින්** හමුවී ඇත්තේ **දැනට හමු වී ඇති පරණි ම ලාංකේය හිටි පිළිමය** ලෙස සලකයි.
- ලාංකේය **ප්‍රතිමා කලාව** සඳහා **අමරාවතී** ආභාසය ලැබී ඇතැයි ඇතැම් විද්වතුන්ගේ අදහස වන නමුත් ස්වාධීන නිර්මාණයක් වශයෙන් එය විකාශය වී ඇත.
- **ඉරියවු අනුව** ඉපැරණි බුද්ධ ප්‍රතිමා **හිටි පිළිම, හිඳි පිළිම හා සැතපෙන පිළිම හෙවත් ඔත් පිළිම** වශයෙන් ත්‍රිවිධාකාර වන අතර පිළිම නෙළීම **ආබද්ධ හා අනාබද්ධ** වශයෙන් දෙයාකාර සිදු කර ඇත.
- මෙම ඉරියවු තුනට අදාළ අනුරාධපුර හා පොළොන්නරු යුගයට අයත් සුවිශේෂ ප්‍රතිමා කිහිපයක් ලෙස **අවුකන, රුස්වෙහෙර, බුදුරුවගල, මාළිගාවිල, ගල් විහාරය, තොළුවිල, මහමෙවුනාව, තන්තිරිමලේ** යන ස්ථානයන්හි පිහිටි ප්‍රතිමා හඳුන්වා දිය හැකිය.
- ලාංකේය කලා කරුවා බුද්ධ ප්‍රතිමා නිර්මාණය සඳහා **කළුගල්, මැටි, බදාම, ලෝහ, කිරි ගරුඬ, ඇත් දත් හා දැව** යන මාධ්‍ය යොදාගෙන ඇත.

බුද්ධ ප්‍රතිමාවේ මුද්‍රා සහ ආසන

- බුද්ධ ප්‍රතිමාවන්හි **මුද්‍රා යන්නෙන් අදහස් කරන්නේ අත් සහ ඇඟිලි උපයෝගී කරගෙන සිදු කරනු ලබන සන්නිවේදන ක්‍රියාවලියකි.**
- බුද්ධ ප්‍රතිමාව සම්බන්ධ ව විවිධ විද්වතුන් විසින් මුද්‍රා රැසක් හඳුන්වා දෙනු ලැබුව ද මෙහිදී සාම්ප්‍රදායික ව ඉදිරිපත් කෙරෙන මුද්‍රා හයක් පමණක් සැලකිල්ලට ගැනෙයි.
- **සමාධි, ධර්මචක්‍ර, අභය, විතර්ක, භූමිස්පර්ශ හා වරද** එම මුද්‍රාවන් ය.

සමාධි මුද්‍රාව හෙවත් ධ්‍යාන මුද්‍රාව

- **වීරාසනයෙන් හෝ පද්මාසනයෙන් හෝ හිඳ උකුළ මත විවෘත කළ වම් අත්ල උඩ දකුණු අත්ල පිහිටුවා සංසුන් ව සිටින ඉරියව්ව** සමාධි මුද්‍රාවයි.
- භාවනානුයෝගී පුද්ගලයකු හිඳගෙන සිටින්නේ මෙම ඉරියව්වෙන්ය.

"නිසීදති පල්ලංකං ආභුජිත්වා උජුංකායං පනිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා" (පලක් බැඳ උඩුකය කෙළින් පිහිටුවා කමටහනට අභිමුඛ ව සිටී) යනුවෙන් පාලි මූලාශ්‍රයයන්හි සඳහන් වන්නේ මෙම මුද්‍රාවයි.

- ලක්දිව ප්‍රකට **මහමෙවුනාවේ සමාධි පිළිමය, තොලුවිල සමාධි පිළිමය, ගල් විහාරයේ සමාධි පිළිමය** ආදි පිළිම රැසක් මෙයට ඇතුළත් ය.

• ලක්දිව හිඳි පිළිමවල බහුල ව මෙම මුද්‍රාව දැකිය හැකි ය.

• මෙම මුද්‍රාව මඟින් සිත එකඟ කර ගැනීම පිළිබිඹු කෙරෙයි.

ධර්ම චක්‍ර මුද්‍රාව

• හිඳි පිළිමවල දක්නට ලැබෙන මුද්‍රාවක් ය.

• **දකුණු අත්ල පිටතට හරවා පපුවේ මට්ටමට තබාගෙන එහි දබර ඇඟිල්ලේ තුඩු දෙක කවයක් සෑදෙන සේ එකට තබා ඇතුළට හැරුණු වම් අතේ ඇඟිල්ලක් ස්පර්ශ කරන අයුරින් පැවැතීම** මෙහි ලක්‍ෂණයයි.

• **ඉන්දියාවේ ප්‍රසිද්ධ සාරානාත් ප්‍රතිමාවේ** මෙම මුද්‍රාව දක්නට ලැබෙයි.

• **ධර්ම දේශනා විලාසය, ධර්මය පැහැදිලි කිරීම** පිළිබිඹු කරයි.

අභය මුද්‍රාව

• හිටි පිළිමවල බහුල ව දැකිය හැකිය. බුද්ධ ප්‍රතිමා තැනීමේ ආරම්භක අවස්ථාවේ පටන් ම දක්නට ලැබෙන මුද්‍රාවක් ය.

• **දකුණු අත උඩට නමා ඇඟිලි සම්පූර්ණයෙන් ම දිගහැර අත්ල ඉදිරිපසට සිටින සේ විවෘත ව තැබීම** මෙහි ලක්‍ෂණයයි. **ලෝක සතුන්ගේ බිය දුරු කිරීම** මෙයින් සංකේතවත් කෙරෙයි.

• ලක්දිව **අවුකන, රැස්වෙහෙර, බුදුරුවගල හිටි පිළිම** මෙම මුද්‍රාවෙන් යුක්තය.

විතර්ක මුද්‍රාව

• **ගැටලුවක් විසඳීම හෝ ධර්මය පැහැදිලි කරදීම** හෝ සංකේතවත් කරයි.

• **ව්‍යාඛ්‍යාන මුද්‍රාව, ඥාන මුද්‍රාව, සනිදර්ශන මුද්‍රාව** යන නම්වලින් ද මෙය හැඳින්වෙයි.

• **අත්ල පපු ප්‍රදේශයට සමීප වන පරිදි දකුණු අත උඩට නමා දබර ඇඟිල්ල මහපට ඇඟිල්ල උඩට කවයක් ඇතිවෙන ආකාරයෙන් තැබීම** මෙහි මූලික ලක්‍ෂණයයි.

• එසේ ම **අත්ල ඉදිරිපසට විවෘත ව තබා ඉතිරි ඇඟිලි තුන දිගහැර තිබීම** ද මෙහි ලක්‍ෂණයක්ය.

• මෙම මුද්‍රාවෙන් යුක්ත බුද්ධ ප්‍රතිමාවක් **බදුලු දිස්ත්‍රික්කයෙන් හමු ව දැනට කොළඹ කෞතුකාගාරයේ** තැන්පත් කර ඇත.

භූමි ස්පර්ශ මුද්‍රාව

• මෙය බුද්ධ හා බෝධිසත්ත්ව ප්‍රතිමාවන්ට පමණක් අනන්‍ය වූ මුද්‍රාවක් ය. හිඳි පිළිමවලට පමණක් ආවේණික මුද්‍රාවක් ය.

• දකුණු අත දකුණු දණ හිස උඩින් අත්ල ඇතුළට සිටින ආකාරයෙන් සියලු ඇඟිලි දිග හැර පොළොව දෙසට යොමු කර සිටීමත් වම් අත උකුළ මත අත්ල උඩට සිටින ආකාරයෙන් තිබීමත් මෙහි ලක්ෂණයයි.

- **බෝමැඩ මාර පරාජයේ දී බුදු රජාණන් වහන්සේ පාරමිතා පිරූ බවට මහ පොලව සාක්ෂ්‍ය දැරීම** සංකේතවත් කිරීම සඳහා මෙම මුද්‍රාව යොදා ගැනෙන.
- මෙම මුද්‍රාවෙන් යුක්ත ප්‍රතිමා ශ්‍රී ලංකාවෙන් සොයා ගැනීම අසීරු ය.

වරද මුද්‍රාව

• දකුණු අත පහත් කොට ඉදිරියට දිග හැර අත්ල උඩු අතට හරවා ඇඟිලි දිග හැර තිබීම මෙම මුද්‍රාවේ ලක්ෂණයයි.

• වරද මුද්‍රාව බෙහෙවින් ම දක්නට ලැබෙන්නේ හිටි පිළිමවලය. මෙම මුද්‍රාවෙන් අර්ථ කිහිපයක් සංකේතවත් කෙරෙයි.

- **වරදානය හෙවත් පොරොන්දු ඉටු කිරීම ද පරිත්‍යාගශීලී ගුණය ද** මෙයින් මූර්තිමත් කෙරෙයි.
- මෙම මුද්‍රාවෙන් යුක්ත පිළිම ශ්‍රී ලංකාවෙහි දුර්ලභ වන නමුදු **ගඩලාදෙණි විහාරයේ ලෝකඩ බුද්ධ ප්‍රතිමාවේ** මෙම මුද්‍රාව දැකිය හැකිය.
- මෙම මුද්‍රා හයට අමතර ව තවත් මුද්‍රා වර්ග ගණනාවක් ගැන ඇතැම් උගතුන් විසින් පෙන්වා දෙනු ලැබ තිබුණ ද ඒවා අතරින් තරමක් ප්‍රචලිත වූවක් ලෙස **පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව** සැලකිය හැකිය.

පරදුක්ඛ දුකඛිත මුද්‍රාව

• පොළොන්නරුවේ ගල් විහාරයේ හිටි පිළිමයේ මුද්‍රාව පරදුක්ඛ දුකඛිත මුද්‍රාව ලෙස ආචාර්ය පරණවිතානයන් සඳහන් කරයි.

• දෑත් වැළමිටෙන් නමා පපුව හරහා කතිරයක් සේ බැඳගෙන සිටින විලාසය මෙහි ලක්ෂණයයි.

• අනුන්ගේ දුකෙහි දී ඇති වන ධර්ම සංවේගය සංකේතවත් කිරීමක් මේ මඟින් සිදුකෙරෙයි.

- පොළොන්නරු ගල් විහාරයේ හිටි පිළිමයේ ඇත්තේ **ත්‍රෛලෝක්‍ය විජය මුද්‍රාව ලෙස කඹුරුපිටියේ වනරතන හිමියන්** හඳුන්වා දී ඇත.

බුද්ධ ප්‍රතිමාවන්හි දැකිය හැකි ආසන

- **යම් තැනක හිඳී නම්** එය ආසනය යනුවෙන් හැඳින්වෙයි.
- පාළියෙහි මෙය පැහැදිලි කෙරෙන්නේ **"ආසති එත්තාති ආසනං"** යනුවෙන්ය.
- ප්‍රතිමා කලාවට අනුව ආසන යනු **හිඳගැනීමට භාවිත ආධාරකය නොව හිඳ ගැනීමේ දී දෙපා තබා ගන්නා විලාසයයි.**
- එහෙත් බුද්ධ ප්‍රතිමා කලාවේ දී ප්‍රධාන වශයෙන් **පද්මාසන, වීරාසන, භද්‍රාසන හා වජ්‍රාසන** යනුවෙන් ආසන වර්ග හතරක් දැක්වෙයි.

පද්මාසනය

- **පද්මයක ආකාරයට හිඳ ගැනීම පද්මාසනයයි.**
- **දණහිස් නමා පතුල් උඩු අතට සිටින පරිදි දකුණු පාදය වම් කලවා උඩත් වම් පාදය දකුණු කලවා උඩත් සිටින ආකාරයෙන් හිඳීම මෙහි ලක්ෂණයයි.**
- **කමලාසන හා ධ්‍යානාසන** යන නම් ද මේ සඳහා භාවිත කරයි.
- බුදු රජාණන් වහන්සේ වැඩ සිටින ආකාරය දැක්වීමට ප්‍රතිමා ශිල්පීන් බහුල ව මෙම ආසන ක්‍රමය යොදාගෙන ඇත. **සමාධිය සංකේතවත් කිරීම** සඳහා මෙය භාවිත කරයි.
- ලංකාවේ පද්මාසනයෙන් යුතු ප්‍රතිමා සොයා ගැනිම දුර්ලභ වන අතර **ඉන්දියාව, බුරුමය, තායිලන්තය, ඉන්දුනිසියාව** වැනි රටවල බහුල ව දක්නට ලැබෙයි.

වීරාසනය

- **වම් පාදය දකුණු පාදය යටින් හා දකුණු පාදය වම් පාදය උඩින් සිටින අයුරින් තබා හිඳ ගැනීම** මෙම ආසනයේ ලක්ෂණයයි.
- මෙය ඉන්දීය ජාතිකයන් සාමාන්‍ය බිම හිඳ ගන්නා ක්‍රමය ලෙස දැක්විය හැකිය. ලංකාවේ හිඳි පිළිමවල බහුල ව දක්නට ඇත්තේ මෙම ආසනයයි.
- **තොලුවිල, මහමෙවුනා උයන, ගල් විහාරය** ඇතුළු ඉපැරණි ස්ථානවල පිහිටි සමාධි ප්‍රතිමා මෙම ආසනයෙන් යුක්තය. අධිෂ්ඨානය මේ මගින් සංකේතවත් කෙරෙයි.

භද්‍රාසනය

- වචනාර්ථයට අනුව **යහපත් වූ සුභ ආසනය** යන අදහස ගැබ් වී ඇත.
- **තරමක් උසට තනන ලද විශේෂ ආසනයක් මත හිඳ කලවා දෙපසට විහිදුවා ආසනයෙන් පහතට වැටෙන පා දෙක පීඨයක මත පිහිටන අයුරින් දක්වෙන්නේ** භද්‍රාසනයයි. **දෙපතුල් තබා ඇති පීඨිකාව පද්මයක ආකාරයට** නිමවා ඇත.
- මෙම ආසනය **යුරෝපීය ක්‍රමයට හිඳගැනීම** යනුවෙන් ද හැඳින්වෙයි.

• **අම්බලන්තොට රිදියාගම විහාර** භූමියෙන් භද්‍රාසනයෙන් යුතු පිළිමයක් හමු වී ඇත.

• **ඉන්දුනීසියාව, ජාවා** යන රටවල මෙම ආසනය බහුල ව දැකිය හැක.

• මෙම ආසනය මඟින් **අකම්ප්‍යතාව** සංකේවත් කරයි.

වජ්‍රාසනය

• **දණහිස නවා දෙපතුල් උඩු අතට දෙකලවා මත තබා සිටීම මෙම ආසනයේ ලක්ෂණයයි**.

• බොහෝ විට මෙය පද්මාසනයට සමානය.

• **බුද්ධත්වාබෝධය අපේක්ෂාවෙන් දැඩි වීර්යයෙන් යුක්ත ව බෝමැඩ වැඩ සිටින ආකාරය නිරූපණය කිරීම** සඳහා මෙම ආසන ක්‍රමය භාවිතා කරයි.

• එබැවින් **වජ්‍රාසනය මඟින් වීර්ය සංකේතවත්** කරයි.

• ලංකාවේ මෙම ආසනයට අදාළ ප්‍රතිමා සොයා ගැනීම දුර්ලභ වුවද **පොළොන්නරුවේ ගල් විහාරයේ ඇති හිඳි පිළිමය** වජ්‍රාසනයෙන් යුක්ත වූවක් යැයි **ආචාර්ය ආනනද් කුමාරස්වාමි** පවසයි.

• මහායාන බුද්ධ ධර්මය පැතුරුණු **ටිබෙට්, චීන, ජපන්** යන රටවල වජ්‍රාසනය බහුල ව දක්නට ලැබෙයි.

පැවරුම -

1. බුද්ධ ප්‍රතිමා නිර්මාණයේ ආරම්භය කෙටියෙන් දක්වා එහිලා භාවිත ආසන හා මුද්‍රා නිදසුන් මගින් විස්තර කරන්න.

2. ක්‍රිස්තු වර්ෂාරම්භයට පෙර බුද්ධ ප්‍රතිමා නිර්මාණය නොවීමට බලපෑ හේතු සාදක ගෙනහැර දක්වන්න.

3. බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය පිළිබඳව පවත්නා මතවාද කෙටියෙන් දක්වා, ගන්ධාර හා මථුරා බුද්ධ ප්‍රතිමාවල සම විෂමතා පෙන්වා දෙන්න.